# ප්‍රවාද සංගතවීම

අපේ සංස්කෘතියෙහි ඇත්තේ සංයුක්ත සාධාරණයකිරීම් ය. එවැනි සාධාරණයකිරීම් පවා හැඳින්වීමට අපට වචනයක් නැත. ඉංගිරිසියෙහි ඇති generalisation යන වචනය සඳහා සුදුසු සිංහල වචනයක් නොමැති වීමෙන් පෙන්නුම් කෙරෙන්නේ අප ඒ සඳහා එතරම් උනන්දුවක් දක්වා නොමැති බව ය. generalisation යන්න සඳහා තනාගෙන ඇති සාධාරණයකිරීම යන්න එතරම් ගැලපෙන්නක් නොවේ. සාධාරණයකිරීම යන්නෙහි සාධාරණය ඉටුකිරීම වැනි අදහසක් ද වෙයි. අනෙක් අතට ඒ සඳහා පොදුකරණය යන්න ද යොදාගැනීම එතරම් සාර්ථක නොවේ. සාධාරණය කිරීම වෙනුවට generalisation යන්න සඳහා වෙනත් වචනයක් නිර්මාණයකර ගත යුතු යැයි සිතමි.

අපේ සංයුක්ත සාධාරණයකිරීම් පවා එවැනි සාධාරණයකිරීම් ලෙස හඳුනා නොගැනෙයි. අප දැනට යොදා ගන්නා වූ සාධාරණයකිරීම යන්න අපේ සංස්කෘතියෙහි තිබුවක් නොවේ. එය ඉංගිරිසි වචනය සඳහා තනාගන්නා ලද වචනයක් පමණකි. ගංගාවෝ ගලා යති, උඩ පැන්නොත් බිම වැටේ, මිටි තැනින් වතුර ගලා යයි ආදිය සංයුක්ත සාධාරණයකිරීම් ලෙස අප ගත්ත ද, ඒ හුදෙක් යම් සංසිද්ධියක බහුවාචී ස්වරූපය පමණක් බව පෙනී යනු ඇත. ගංගාවෝ ගලා යති යන්න අදාළ වන්නේ අපට දැකගත හැකි අවශ්‍ය නම් සිතෙන් මවාගත හැකි ගංගා සඳහා මිස වස්තුව හෝ වස්තුව වැනි සිතෙන් මවාගත නොහැකි දෑ සඳහා නොවේ. උඩ පැන්නොත් බිම වැටේ යන්නෙන් අදහස් කෙරෙන්නේ උඩ පනින වස්තු නොව උඩ පනින මිනිසුන් ය. ඉන් කියැවෙන්නේ උඩ පනින මිනිසුන් බිම වැටෙන බව ය. මිටි තැනින් වතුර ගලා බහී යන්න ද අපට දැකගත හැකි සිතෙන් මවාගත හැකි සංසිද්ධියකි.

මෙහි දී යමකුට ඇසිය හැකි ප්‍රශ්නයක් නම් අපේ සංස්කෘතියෙහි ඇති පුනරුත්පත්තිය යන්න දැකගත හැකි දෙයක් ද යන්න ය. මිනිසුන් ද සතුන් ද මැරෙන බව අප දකින අත්විඳින දෙයකි. එහෙත් සත්ත්වයන් නැවත ඉපදෙන බව දන්නේ කෙසේ ද? අපි මිය යන සත්ත්වයකු නැවත ඉපදෙන බවක් නොදකින්නෙමු. එසේ නම් එවැනි නිරීක්ෂණයක් අපට ලැබෙන්නේ කෙසේ ද? මේ නිරීක්ෂණය පැරණි සෘෂිවරුන් ලබාගත් දේ යැයි සිතිය හැකි ය. පැරණි සෘෂිවරුන් සිත දියුණු කිරීමෙන් දැකගත් දේ පිළිබඳ ව අනෙක් මිනිසුන්ට දැනුම් දෙන්නට ඇතැයි සිතිය හැකි ය. ඒ කෙසේ වෙතත් එය ද අපට ලැබෙන්නේ බහුවාචී සංසිද්ධියක් ලෙස ය.

අපේ ප්‍රවාද බොහෝ විට එවැනි සංයුක්ත සාධාරණයකිරීම් සඳහාවත් නොවේ. කලින් සඳහන් වී ඇති පරිදි ප්‍රවාද යනු කතන්දර වෙයි. අපේ කතන්දර බොහෝ විට ගෙතෙන්නේ තනි තනි සිද්ධි සම්බන්ධයෙනි. මේ සම්බන්ධ උදාහරණ රාශියක් වෙයි. අප කතාකරන්නේ අහවල් රජුගේ දෙයක් මිස හිතෙන්වත් මවාගත නොහැකි ඊනියා පාලකයන්ගේ රාජ්‍යත්වයක් ගැන නොවේ. කාල් මාක්ස් පඬිවරයා විසින් ගොතන ලද අන්දමේ කතන්දර ගෙතීමට අපේ සංස්කෘතියෙන් අනුබල නොලැබෙයි. මුළු මහත් ලෝකයට ම වලංගුවන පරිදි ඊනියා ඓතිහාසික භෞතිකවාදයක් නැතහොත් ඉතිහාසය පිළිබඳ වියුක්ත සාධාරණ ප්‍රවාදයක් ගොඩ නැගීමට ඔහු උත්සාහ කෙළේ ය. එය අතිශයින් ම අසාර්ථක ව්‍යාපෘතියක් විය. එහෙත් අපට වැදගත්වන්නේ එහි සාර්ථක අසාර්ථකභාවය නොව ඔහු එවැනි ප්‍රවාදයක් ගොඩනැගීම ය. යුදෙව්වකු ලෙස ඉපදී යුදෙව්වකු ලෙස හැදුණු වැඩුණු කාල් මාක්ස් තරුණයා යුදෙව් චින්තනයේ උරුමක්කරුවෙක් විය. ඔහු තම ප්‍රවාද නිර්මාණය කෙළේ යුදෙව් චින්තනය මත පදනම් වෙමිනි. ඔහු උත්සාහ කෙළේ මුළු ලෝකයට ම එක ම ආකාරයේ විකාශයක් ලබා දීමට ය. මුළු ලෝකයේ ම සංස්කෘතිය බටහිර සංස්කෘතිය විය යුතු යැයි ඔහු ඇදහුවේ ය. ඒ අතින් ගත්කල ඔහු අංක එකේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදියෙක් විය.

ඉතිහාසය ද ඇතුළු සියළු දැනුම් පද්ධති නිර්මාණය කෙරෙන්නේ මිනිසුන් විසිනි. එහෙත් බටහිරයන් මෙන් වියුක්ත සාධාරණ පද්ධති අපේ සංස්කෘතීන් තුළ ගොඩ නොනැගෙයි. ආසියාවේ වඩාත් ම වියුක්ත සංස්කෘතියක් තිබූ භාරතීය වෛදිකයන්වත් බටහිර මෙන් වියුක්ත ප්‍රවාද ගොඩනගා නොමැති බව පැහැදිලි ය. මෙරට එක් පඬිවරයකු සිංහල භාෂාවෙන් බුදු දහම දේශනාකළ බව පිළිගැනීමට අකමැති බව කලින් සඳහන් කර ඇත. ඒ පඬිවරයාට අනුව මිහිඳු හිමිපාණන් වහන්සේ ධර්ම දේශනාකර ඇත්තේ මාගධී ප්‍රාකෘතයෙන් ය. මාගධී ප්‍රාකෘතය සිංහලට සමීප බැවින් මිහිඳු මහා රහතන් වහන්සේ මාගධී ප්‍රාකෘතයෙන් දේශනාකළ දහම අසා තේරුම්ගැනීම එකල විසූ සිංහලයන්ට ප්‍රශ්නයක් වී නැතැයි යන්න ඒ පඬිවරයාගේ අදහස වෙයි.

© Prof. Nalin De Silva

මෙහි ඇත්තේ ද ප්‍රවාදයකි. එය ඉතා සංයුක්ත ප්‍රවාදයකි. ඒ ප්‍රවාදයෙන් මුලින් ම කියැවුණේ අටුවා සිංහලයෙන් නොලියැවුණු බවත් එකල සිංහල භාෂාව එතරම් දියුණු නැති බවත් ය. එහෙත් අපේ පඬිවරයාට එසේ කියා පැන යෑමට නොහැකි ය. ඒ සමග පැනනගින ප්‍රශ්න නම්, එය එසේ නම් හෙළටුවා යනුවෙන් සඳහන් වන්නේ ඇයි ද යන්නත් මිහිඳු රහතන් වහන්සේ සිංහලෙන් ධර්මය දේශනා නොකෙළේ නම් ඒ ශ්‍රවනය කළවුන් ඒ ධර්මය තේරුම් ගත්තේ කෙසේ ද යන්නත් ය.  මෙතැන ඇත්තේ සංගත වීම පිළිබඳ ප්‍රශ්න දෙකකි. තනි සිද්ධියක් පිළිබඳ වූ සංයුක්ත ප්‍රවාදයක් වුව ද එය අනෙක් අදාළ කරුණු සමග සංගත විය යුතු ය. එසේ සංගත නොවේ නම් ඒ ප්‍රවාදයෙන්, එනම් කතන්දරයෙන් හෝ ප්‍රශ්නයකට දී ඇති  පිළිතුරෙන් සෑහීමකට පත්විය නොහැකි ය.

මෙයින් පැහැදිලි වන්නේ තම තමන්ගේ මතවාද වෙනස්විය හැකි වුව ද,  ඒ ඒ අය ගොඩගන ප්‍රවාද සංගත විය යුතු බව ය. ප්‍රවාදය යොදා ගැනෙන වටපිටාවෙහි, ප්‍රවාදය සංගත නොවුණහොත් එය නොපිළිගැනීමට හේතු වෙයි. වියුක්ත සාධාරණ වුව ද, සංයුක්ත සාධාරණ වුව ද. එකම සිද්ධියකට පමණක් අදාළ වුව ද, ප්‍රවාද ඒ ගොඩනැගෙන පසුබිමෙහි සංගත විය යුතු ය. අපේ පඬිවරයාට ඉදිරිපත් කෙරෙන ප්‍රධාන ම ප්‍රශ්නය නම් හෙළ අටුවා ඒ නමින් හැඳින්වෙන්නේ ඇයි ද යන්න ය. එයට පඬිවරයා කදිම පිළිතුරක් දෙයි. ඔහු කියන්නේ හෙළ අටුවා යනු හෙළ බසින් රචනා කරන ලද කෘතීන් නොව හෙළයෙහි, එනම් සිංහල දේශයෙහි ග්‍රන්ථාරූඪ කරන ලද කෘති බව ය. අප පඬිවරයා ඉන්පසුව කියන්නේ එකල විසූවන්ට මිහිඳු හිමිපාණන් වහන්සේ දේශනාකළ ධර්මය තේරුම් ගත හැකි වූයේ, ධර්මය දේශනා කළ මාගධී ප්‍රාකෘතය සිංහලට සමාන වූ නිසා බව ය.

මෙලෙස පිළිතුරු දෙන අප පඬිවරයා නොසිතන දේ කුමක් ද? මාගධී ප්‍රාකෘතය සිංහලට සමාන නම් හා මාගධී ප්‍රාකෘතය බුද්ධ ධර්මය දේශනා කිරීමට තරම් පොහොසත් වී නම් පැරණි සිංහල භාෂාව ද සද්ධර්මය දේශනා කිරීමට තරම් පොහොසත් විය යුතු ය. පැරණි සිංහල භාෂාව එතරම් දියුණු නැතැයි උපකල්පනය කෙළේ නම් ඒ උපකල්පනයට විරුද්ධව යන නිගමනවලට නොඑළඹීමට අප පඬිවරයා ප්‍රවේශම් විය යුතුව තිබුණි. එහෙත් ඔහුට ඒ බව අමතක වූයේ ප්‍රවාද ගොඩනැගීමේ දී සංගත විය යුතු ය යන මුල් පාඩම එක්කෝ ඔහු නොදැන සිටීම ය; නැත්නම් ඔහුට සංගත ප්‍රවාදයක් ගොඩනගා ගැනීමට නොහැකි වීම ය. අනෙක් අතට මාගධී ප්‍රාකෘතය සිංහල බසට සමීප නම් මාගධී ප්‍රාකෘතය දැන සිටි මිහිඳු මහා රහතන් වහන්සේට සිංහල බස ඉගෙන ගැනීම එතරම් අපහසු කරුණක් වී යැයි සිතිය නොහැකි ය. මාගධී ප්‍රාකෘතය සිංහලට සමාන බවට අප පඬිවරයාට පිළිගැනීමට සිදු වීම තුළින් ඔහුගේ මුල් උපකල්පනය බිඳ වැටෙයි.

ප්‍රවාදය ගොඩ නගා ඇත්තේ එක් කරුණක් පමණක් මත වුව ද අදාළ වෙනත් කරුණු සමග සංගතවන ලෙස ප්‍රවාදය ගොඩ නැගිය යුතු වෙයි. එසේ නැතහොත් ප්‍රවාදය අවලංගු වෙයි. අපේ සංස්කෘතියෙහි ඇති තනි තනි සිද්ධි සඳහා ගොඩනගා ඇති ප්‍රවාදයක් දෙකක් අපි විමසා බලමු. සඳකඩපහණ යනු කුමක් ද? එයින් සංකේතවත්වන්නේ කුමක් ද? මේ තනි සිද්ධියකි. එහෙත් මෙරට අවුරුදු ගණනාවක් තිස්සේ මේ ප්‍රශ්නයට උත්තර දීමට විවිධ උගතුන් උත්සාහ ගෙන ඇත. එහෙත් මේ එක් උත්තරයක්වත් පිළිගත හැකි තත්ත්වයක නැත. ඒ සෑම පිළිතුරක් ම, එනම් ප්‍රවාදයක් ම පාහේ කෘත්‍රිම වෙයි. සඳකඩපහණ සංගත විය යුත්තේ එකම එක කරුණක් හා සම්බන්ධව ය. එනම් බෞද්ධ සිද්ධස්ථානයකට ඇතුල්වීම හා සම්බන්ධව ය. එබැවින් බොහෝ දෙනා සඳකඩපහණ නිවන, සිත නිවීම ආදිය සමග සම්බන්ධ කරමින් තේරුම් කර දීමට, එනම් ප්‍රවාද තැනීමට උත්සාහ ගනු පෙනෙයි. මෙහි දී උපකල්පනය කෙරෙන්නක් ද වෙයි. එනම් සඳකඩපහණෙන් යමක් සංකේතවත් වන බව ය. සඳකඩපහණ නම් තනි සංසිද්ධිය පිළිබඳ ප්‍රවාද ගොඩනැගෙන්නේ මේ උපකල්පනය මත ය. සඳකඩපහණෙන් කිසිවක් සංකේතවත් නොවන්නේ නම් කුමක් සිදුවෙයි ද?

බෞද්ධ සිද්ධස්ථානයකට ඇතුල්වන තැන නිර්මාණය කර ඇතැයි උපකල්පනය කළහොත් සඳකඩපහණ පිළිබඳ ව ප්‍රවාද රාශියක් ම ගොඩනැගිය හැකි බව දැනට ඒ සම්බන්ධයෙන් දී ඇති පිළිතුරුවලින් පැහැදිලි වෙයි. දත්ත අඩුවන විට දිය හැකි පිළිතුරු සංඛ්‍යාව වැඩි වෙයි. සඳකඩපහණ සිද්ධස්ථානයකට ඇතුල්වීමේ දී පෑගීමට ඇති පාපිස්නක් වැන්නක් යැයි උපකල්පනය කෙරෙන බව ද පෙනෙයි. එහෙත් එය එවැන්නක් බව අප දන්නේ කෙසේ ද? සඳකඩපහණ පෑගීම සඳහා නොව නොපෑගීමට නිර්මාණය කරන ලද්දක් නම් ඒ ගැන දිය හැකි අර්ථකථන කවරේ ද?

© Prof. Nalin De Silva

සිංහලයන්ගේ ඉතිහාසය ගැන ඇති පළමු ප්‍රවාදය නම් විජය කතාව ය. විජය කතාව මිථ්‍යාවක් බවත් එබැවින් සිංහලයන්ගේ ඉතිහාසය ම මිථ්‍යාවක් බවත් ඇතැම් ප්‍රබුද්ධ ඇංකරයෝ කියති. ඔවුන් කියන්නේ සිංහබාහු ප්‍රවාදය මිථ්‍යාවක් බව ය. සිංහයකුට දාව මිනිස් ස්ත්‍රියකට දරුවන් බිහිවිය නොහැකි යැයි මේ පණ්ඩිතයෝ අපට පෙන්වා දෙති. බටහිර ජීව විද්‍යාවෙහි එවැන්නකට ඉඩක් නැති බව ඔවුහු අපට කියති. එහෙත් සිංහබාහු ප්‍රවාදය අයත්වන්නේ බටහිර ජීව විද්‍යාවට නොවන බව ඔවුහු නොදනිති. අපට සිංහබාහු ප්‍රවාදය වැදගත් වන්නේ එය බටහිර ජීව විද්‍යාවට අයත්වීම හෝ නොවීම හෝ නිසා නොවේ.

සිංහබාහු ප්‍රවාදය වැනි ප්‍රවාදයක් නිර්මාණය කිරීමට එකල විසූ සිංහලයන්ට අවශ්‍ය වූයේ ඇයි? අප පළමුවෙන් ම පිළිතුරක් සොයා ගත යුත්තේ, එනම් පිළිතුරක් නිර්මාණය කර ගත යුත්තේ ඒ ප්‍රශ්නය සඳහා ය. සිංහබාහු ප්‍රවාදය යනු යම් ප්‍රශ්නයකට දෙන ලද පිළිතුරකි. මේ ප්‍රශ්නය අන් කිසිවක් නොව සිංහලයන්ගේ සම්භවය කෙසේ සිදු විණි ද යන්න ය. අපට පිළිතුර මෙන් ම ප්‍රශ්නය ද වැදගත් වෙයි. මේ ප්‍රශ්නය අද ඊයේ නොව අඩුම තරමින් හතරවැනි සියවසේ දී අසා තිබුණි. ඒ ප්‍රශ්නය අසන්නට එක් පූර්ව අවශ්‍යතාවයක් සපුරාලිය යුතු ය. එනම් එකල සිංහල නමින් ජාතියක් තිබිය යුතු ය. සිංහල ජාතියක් නැතිව සිංහල ජාතියෙහි සම්භවය ගැන ප්‍රශ්න ඇසිය හැකි නොවේ. විජය කතාවෙන් කියැවෙන ප්‍රධාන ම කරුණ නම් සිංහලයන් නමින් පිරිසක් මේ දිවයිනෙහි අඩුම තරමින් හතරවැනි සියවසෙහි සිටි බව ය. මෙරට ඇතැම් කසිකබල් ඉතිහාසඥයන් සිංහල ජාතිය ඇති වූයේ දහවැනි සියවසට පසුව යැයි කියති. තවත් ඇතැම් මාක්ස්වාදීහු තවමත් සිංහල ජාතියක් ඇති වී නැතැයි කියති. ඔවුන්ට අනුව සිංහල නමින් ජාතියක් ඇති වීමට නම් පළමුවෙන් ධනපති ක්‍රමය වර්ධනය විය යුතු ය. එයට හේතුව කසිකබල් මාක්ස්වාදයට අනුව ජාතිය යන්න ධනපති ක්‍රමයේ නිර්මාණයක් වීම ය. සිංහබාහු ප්‍රවාදය ඊනියා ජීව විද්‍යාවට එකඟ වුවත් නැතත් මේ පණ්ඩිතයන් නිරුවත් කරයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva